# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,285 — 1965 ජනවාරි 6 වැනි බදාදා — 1965.1.6

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වන කොටස: (I) වන ඡෙදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

## මිල පාලන දැන්වීම්

පො. දි 2/64 දරණ ආහාර මිළ නියෝගය. — අතිරේක ආහාර ද්‍රව්‍ය

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

#### නියෝගය

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක තැන්පත් අයිවන් සමරවික්‍රම වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතෙහි 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු හතරවැනි වගන්තිය යටතේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක තැන වෙත පැවරී ඇති බලතල අනුව—

(i) 1962 නොවැම්බර් 12 වැනි දින අංක 13,391 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක පීඇල්. 8/62 සහ 1962 නොවැම්බර් 7 වැනි දින දරණ ආහාර මිළ නියෝගය අද සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(ii) 1950 අංක 29 දරණ මිළ පාලන පණත අනුව සකස් වුනු, මීට යාකර ඇති දෙවැනි උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් එක් එක් ආහාර ද්‍රව්‍ය කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළට, මීට යාකර ඇති දෙවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ අනුපිළිවෙලින් සඳහන් කර ඇති මිළ ගණන් එකතු කිරීමෙන් පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කය තුළ එම උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍ය මේ දැන් පටන් විකිණිය හැකි වැඩිම තොග මිළ ගණන් සකස්කර ගත යුතු බැව් මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) 1950 අංක 29 දරණ මිළ පාලන පනත අනුව සකස් වුනු, මීට යාකර ඇති තුන්වැනි උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් එක් එක් ආහාර ද්‍රව්‍ය කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දෙකුට ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට, මීට යාකර ඇති තුන්වැනි උපලේඛනයේ 2 වැනි තීරයේ අනු පිළිවෙලින් සඳහන් කර ඇති මිළ ගණන් එකතු කිරීමෙන් මීට යාකර ඇති පළමුවැනි උප ලේඛනයේ සඳහන් අංක 1, 2 සහ 3 දරණ ප්‍රදේශයන් තුළ තුන්වැනි උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් එක් එක් ආහාර ද්‍රව්‍ය මේ දැන් පටන් විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ සකස් කරගත යුතු බැව් මෙම නියෝගයෙන් නියම කරමි.

(iv) තවද, මෙම නියෝගයෙහි කාර්‍ය්‍ය සඳහා—

(අ) දෙවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සහ තුන්වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍යයකින් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ දෙවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ හා තුන්වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකන බවත්,

(ආ) දෙවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ හා තුන්වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍යයකින් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකන බවත්,

(ඇ) දෙවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ හා තුන්වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍ය තොග වශයෙන් විකුණන විට දළබර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(v) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම දෙවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ හා තුන්වැනි උප ලේඛණයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(vi) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම ස්ථානයක හෝ යම් වාහනයක දෙවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ හා තුන්වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍යය සඳහා මේ නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට එකී ද්‍රව්‍යය සහ නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.


55—ආර් 3028—6,075 (65/1)

(vii) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා " රාත්තල " හෙවත් " රා. " යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(viii) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම දෙවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ හා තුන්වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා දෙවැනි උප ලේඛණයේ 1 වැනි තීරයේ හා තුන්වැනි උප ලේඛණයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන් ද නැතහොත් සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම් කරමි.

(ix) දෙවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ හා තුන්වැනි උප ලේඛණයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍යය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහා ලනු ලැබුවේ නම් එහි මිළත් දෙවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ හා තුන්වැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත්වී ඇති බවද මෙම නියෝගයෙන් නියම කරමි.

1964 දෙසැම්බර් මස 29 වැනි දින පෙරවරු 10.00 ට පොළොන්නරුව දිසාපති කාර්යාලයේදී අත්සන් තබන ලදී.

අයිවන් සමරවික්‍රම,
පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ
(ආහාර) පාලක තැන.

## පළමුවැනි උපලේඛනය

අංක 1 දරණ ප්‍රදේශය—

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් සිංහල පත්තුව :—

අංක 70 දරණ ගිරිතලේ ග්‍රාම සේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—ගිරිතලේ, ජයන්ති කොළණිය, නුගගහදමන, රාජගිරිය යන ගම්
අංක 71ඒ දරණ හිඟුරක්ගොඩ ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—හිඟුරක්ගොඩ සහ උල්පත්වැව යන ගම්
අංක 71ඊ දරණ හිඟුරක ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—හිඟුරක්ගල, හිඟුරක, හතමුන හා කොටුවෙල යන ගම්

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් මැද පත්තුව ;—

අංක 72ඒ දරණ උඩවෙල (අළුත්වැව) ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අළුත්වැව, පරාක්‍රම සමුද්‍රය බ්ලොක් "ඊ" ගණන්ගොල්ල හා තෝපාවැව වාරිමාර්ග නගරය යන ගම්
අංක 73 දරණ තෝපාවැව ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—ආනළුලුන්දව බැදිවැව, පොළොන්නරුව, තෝපාවැව හා කුන්කෙම යන ගම්
අංක 73ඒ දරණ කුඹුක්කන් ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—පැරකුම් උයන, ලක්ෂ උයන, සිංහපුර හා විජයබාහුපුර යන ගම්
අංක 74 දරණ මානික්කම්පට්ටිය ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—ගල්ලැල්ල, කොටලිය, මානික්කම්පිටිය හා මාවිල යන ගම්
අංක 74ඒ දරණ කදුරුවෙල ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—කෘෂිකර්ම ගොවිපළ, කදුරුවෙල සහ මුස්ලිම් කොළණිය යන ගම්

අංක 2 දරණ ප්‍රදේශය—

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් සිංහල පත්තුව :—

අංක 71 දරණ මින්නේරිය ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—බැද්දේපන්විල, හල්මිල්ලැව, කටුකැලියාව, මින්නේරිඝ, බත්ගම් පත්තුව, මින්නේරිය දුම්රිය නැවතුම්පොළ හා රජඇළ යන ගම්
අංක 71සී දරණ වෙහෙරඑළිය ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—ගල්අමුණ, කිරිමැටිය, රන්කොත්ගම, සන්සුන්ගම, වෙහෙර එළිය සහ යටියල්පතාන යන ගම්
අංක 71බී දරණ යෝධඇල ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—කවුඩුල්ල බ්ලොක් "සී" (කොටසක්), යටියල්පතාන, යෝධඇල බ්ලොක් "ඒ" සහ "බී" යන ගම්
අංක 71ඩී දරණ උල්කටුපොත ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—හිඟුරක්ගොඩ කෘෂිකර්ම ගොවිපළ සහ වින්සර්පාක් යන ගම්
අංක 71 ඇෆ් දරණ හිඟුරක්දමන ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—බී.ඕ.පී. 317, ගල්අමුණ සහ හිඟුරක්දමන යන ගම්

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් මැද පත්තුව :—

අංක 72 දරණ කොටවැල්ල ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අඹන්ගඟ, කොටවැල්ල, අංගම්මැඩිල්ල, දස්තොට, දුඹුටුළුවැව, එරමුදුඹය, කලහගල, කුකුරුමාන්වෙල හා නිතුලාවෙල යන ගම්
අංක 73බී දරණ කාලිංගඇල ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—ගැමුණුපුර, හේවාගම, මොනරතැන්න, පහලගම හා වැවේතැන්න යන ගම්
අංක 73සී දරණ පළුගස්දමන ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—පළුගස්දමන, ගල්තඹරාව හා වඩිච්චලේ යන ගම්
අංක 75 දරණ පුදූර් ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—දිවුලාන, පුදූර් හා පුදූර් අටුතෝටම් යන ගම්

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් එගොඩ පත්තුව :—

අංක 84 දරණ මනම්පිටිය ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—දළුකාන, ගැටමුනේ, කොස්ගහ උල්පොත, මහගන්තොට, මනම්පිටිය, පුදුකුඩි හා පුදුවෙලි යන ගම්
අංක 83 දරණ කරපොළ (හැවන්පිටිය) ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—බොරවැව, ගිනිදමන, හැවන්පිටිය, කරපොල, කොළකනාවෙලි හා වල්ලිදළුර් යන ගම්

අංක 3 දරණ ප්‍රදේශය—

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් සිංහල පත්තුව :—

අංක 67 දරණ මොරගස්වැව ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අඹගස්වැව දෙහිඅත්තාව, ගල්ලිඳ, හබරණ දුම්රිය නැවතුම්පොළ, ඉළුක්වැව, මොරගස්වැව, මොරකන්ද, පොතාන තල්බැද්ද, තිඹිරිගස්වැව සහ උණගොල්ලැව යන ගම්
අංක 68 දරණ කවුඩුල්ල ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අළුත්ඔය, කුතුලන්තාව, දිවුලංකඩවල, ගල්ඔය, ගල්ඔය හන්දිය, හතරුස්කොටුව, කිරියගස්කොටුව, මැදිරිගිරිය, පෙතියන්නෑඔය, රත්මලේ, රොටවැව, වැතිගහේවැව, හා යටියල්පතාන යන ගම්
අංක 69 දරණ කැලෑගම් ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අළුත්වැව, බැරිවිල, කුඹුක්කන්වෙල, කුරුංගවෙට්ටි, මීගස්වැව, මීගොල්ලැව, පළුගහවැව, තලාකොලවැව හා වඩිගවැව යන ගම්
අංක 70ඒ දරණ කෝඳුරුවැව ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අත්තනකඩවල, දියබෙදුම, ඉහකුළුවැව, කටුකෙලියාව කොළණිය හා කෝඳුරුවැව යන ගම්
අංක 70බී දරණ කෝට්ටපිටිය ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—හැගල, කෝට්ටපිටිය, පුවක්ගහඋල්පොත යන ගම්
අංක 70සී දරණ ඇලහැර ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අත්තරගල්ලැව, බකමූණ, ඇළහැර හා හිරවිය යන ගම්

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් මැද පත්තුව :—

අංක 75ඒ දරණ ඕනෑගම ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—ඕනෑගම කොළණිය හා පුදූර් කොළණිය යන ගම්.

අංක 76 දරණ තල්පොත ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—හේවාතැන්න, සේනානායක පුර, වීරපුර හා විජයබාහුපුර යන ගම්.

අංක 77 දරණ තඹාල ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—බී.ඕ.පී. 314 නැගෙනහිර, ගල්කැටිය දමන, ඕනෑගම, සිත්නගංගා, සිත්නවිල්ලුපිටිය, තාඹාල හා උරනෙයි යන ගම්.

අංක 78 දරණ සුංගාවිල ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—කිරිමැටියදමන, කුමාඩිය, මීන්විල්ලු, සෝමාවතිය, සුංගාවිල හා සුංගාවිල පුදූර් යන ගම්.

අංක 78ඒ දරණ කුමාඩිය ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අභයපුර, කැගලුගම හා පුලස්තිගම යන ගම්.

අංක 79 දරණ පල්ලියගොඩැල්ල ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අඩම්පන්ආරු, බොරුපන්විල, අලි කෙළි අඩිතෙත්ති, කුරුංචිමුණෙයි, පල්ලියගොඩැල්ල, පඟුරාණ හා පුදුවෙලි යන ගම්.

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් එගොඩ පත්තුව :—

අංක 80 දරණ කාණ්ඩකාඩු ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අන්ගොඩ, ඉලන්දමොදෙයි, කෝසාකුලම, කුරුංචිමුණෙයි, මාවිල, පාම්බුකුල්මුණෙයි, රොටවැව, රෙට්ටිවාකුලම, තැන්නතෝට්ටම් හා ත්‍රිකුණාමාඩු යන ගම්.

අංක 81 දරණ මුතුගල ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—නෙල්වැල්ලිනාකුළම පච්චකාඩුවේන, තිරිමුණෙයිවිල්ලු, කටුවන්විල මුතුගල වට්ටවවේන යන ගම්.

අංක 82 දරණ මාකුප්පෙ ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අංගිරියදමන බෙල්ලනේවිල, කඩවතුමඩු, කලුමඩු, කුමාරපුරගම, කුරුන්විදමන, මාකුප්පේ, පුල්ලෙයාර්අඩි, සූරියෝදෙයි හා වැළිකන්ද යන ගම්

අංක 85 දරණ අළවාකුඹුර ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අළවාකුඹුර, බැදියවිල, දමනේ උල්පොත, අරලගන්විල, ගල්කුළම, සොරිවිල, කන්දේගම, කුඩාඋල්පොත, මල්ලියතිව්, උල්පොතවැව, හා වෙහෙරගොඩ යන ගම්.

අංක 85 ඒ දරණ යක්කුරේ ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—යක්කුරේ සහ කළුකැලබෙ යන ගම්.

## දෙවැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>විස්තර | 2 වැනි තීරය<br>කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකුණන මිළට පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළදී එකතු කළ යුතු වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| ළූණු (රතුළූණු සහ වික්බෙලපූර් හැර වෙනත් සියළුම) | 2 75 |
| අර්තාපල් | 2 75 |
| සුදුරු | 3 75 |
| කොත්තමල්ලි | 3 75 |
| කහ | 3 75 |
| උළුඳු (පියළි නොකළ) | 3 75 |
| මුංඇට | 3 75 |
| තෝර පරිප්පු | 3 75 |
| කඩල පරිප්පු | 3 75 |
| වික්පිස් | 3 75 |
| සුදුළූණු (බොම්බෙ) | 3 75 |
| සියඹලා | 3 75 |
| රතුළූණු | 2 75 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකියි.

## තුන්වැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>විස්තර | 2 වැනි තීරය<br>කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකුණන මිළට පළමුවෙනි උපලේඛනයේ සඳහන් ප්‍රදේශය තුළදී එකතුකළ යුතු වැඩිම මිළ<br>1 වැනි ප්‍රදේශය<br>රු. ශ. | <br><br>2 වැනි ප්‍රදේශය<br>රු. ශ. | <br><br>3 වැනි ප්‍රදේශය<br>රු. ශ. |
|---|---|---|---|
| ළූණු (රතුළූණු සහ වික්බෙලපූර් හැර වෙනත් සියළුම) | 0 03 | 0 04 | 0 05 |
| අර්තාපල් | 0 03 | 0 04 | 0 05 |
| සුදුරු | 0 04 | 0 05 | 0 06 |
| කොත්තමල්ලි | 0 04 | 0 05 | 0 06 |
| කහ | 0 04 | 0 05 | 0 06 |
| උළුඳු ( පියළි නොකළ) | 0 04 | 0 05 | 0 06 |
| මුංඇට | 0 04 | 0 05 | 0 06 |
| තෝරපරිප්පු | 0 04 | 0 05 | 0 06 |
| කඩල පරිප්පු | 0 04 | 0 05 | 0 06 |
| වික්පිස් | 0 04 | 0 05 | 0 06 |
| සුදුළූණු (බොම්බෙ) | 0 04 | 0 05 | 0 06 |
| සියඹලා | 0 04 | 0 05 | 0 06 |
| රතුළූණු | 0 03 | 0 04 | 0 05 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය. එම මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකියි.

**ආපා/4/3 දරණ මිළ නියෝගය.** **හරක් මස් හා එළු මස්**

## මිළ පාලන පනත

### නියෝගය

අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක තැන්පත් රාජගල්ගොඩ ගමගේ සෝෂක ඕල්කොට් ගුණසේකර වන මම, (173 අධිකාරය වන) මිළ පාලන පනතේ 3(2) වගන්තිය සමග කියවෙන 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව මෙම නියෝගය මගින් මෙහි පහත සඳහන් නියමයන් කරමි :—

1. මෙහි වූ උපලේඛනයේ 2 සිට 5 දක්වා තීරයන්හි සඳහන් මිළ ඒ තීරයන්හි මුදුනේ සඳහන් වර්ගයට හා ශ්‍රෙණියට අයත් හරක් මස් හා එළු මස් ඒ උපලේඛනයේ 1 වන තීරයේ අනු පිළිවෙලින් සඳහන් කොට ඇති ප්‍රදේශයන් තුළ විකිණිය යුතු උපරිම මිළ ලෙස මේ මොහොතේ සිට ක්‍රියාත්මක කළ යුතු බව නියෝග කරමි.

2. තවද මෙම නියෝගයේ කාය‍්‍යීය සඳහා—

 (අ) " හරක් මස් " යන පාඨයෙන් හරකුන්ගේ හා මී හරකුන්ගේ මස් අදහස් කෙරෙයි. එහෙත් සියළුම වර්ගවල මාංශාවශේෂ ඉන් බැහැර කළ යුතුය. ගවයෙකුගේ සිරුර මස් මඩුවේදී පිළියෙල කිරීමේදී එනම් බොකු, බඩවැල්, හිස, හම, කුර හා වෙනත් සියළුම ක්‍රමයේ සාමාන්‍යයෙන් ඉවත් කරනු ලබන දෑය මෙයට ඇතුළත් නොවේ.

 (ආ) " එළු මස් " යන පාඨයෙන් එළුවන්ගේ හා බැටළුවන්ගේ මස් අදහස් කෙරෙයි. එහෙත් සියළුම වර්ගවල මාංශාවශේෂ ඉන් බැහැර කළ යුතුය. එළුවකුගේ හෝ බැටළුවකුගේ හෝ සිරුර මස් මඩුවේදී පිළියෙල කිරීමේදී එනම් බොකු, බඩවැල්, හිස්, හම, කුර හා වෙනත් සියළුම ක්‍රමයේ සාමාන්‍යයෙන් ඉවත් කරනු ලබන දෑය මීට ඇතුළත් නොවේ.

3. කටු සහිත ' හරක් මස් ' හෝ ' එළු මස් ' විකිණීමේදී ඒ සමඟ විකුණූ කටුවල බර විකුණූ මුළු බරින් සියයට විසි පහකට වැඩි නොවිය යුතුයි.

4. මෙහිවූ උපලේඛනයේ 1වන තීරයේ සඳහන් ප්‍රදේශයන් තුළවූ යම් ස්ථානයක ඒ උපලේඛනයේ සඳහන් වර්ගයට හා ශ්‍රෙණියට අයත් හරක් මස් හෝ එළු මස් තම සන්තකයෙහි තබාගෙන ඇති සෑම වෙළෙන්දෙකුම ඒ වර්ගයේ හෝ ඒ ශ්‍රෙණියේ හරක් මස් හෝ එළු මස් සම්බන්ධයෙන් මෙම නියෝගය මගින් නියමිත උපරිම මිළ සඳහන් කළ දැන්වීමක් එකී ස්ථානයේ පැහැදිලිව පෙනෙන සේ ප්‍රදර්ශනය කළ යුතුයි.

5. හරක් මස් හෝ එළු මස් විකිණිය යුත්තේ නැතහොත් විකිණීම සඳහා ප්‍රදර්ශනය කළ යුත්තේ ඒ සඳහා වෙන් කොට ඇති වෙළෙඳ පිල්වල පමණක් වන අතර එම වෙළෙඳ පිල්වල වෙනත් වර්ගයක හෝ වෙනත් ශ්‍රෙණියක හෝ මස් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ නොකළ යුතුය.

6. මෙහිවූ උපලේඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශයන් තුළවූ යම් ස්ථානයක ඒ උපලේඛනයේ සඳහන් වර්ගයට හෝ ශ්‍රෙණියට හෝ අයත් හරක් මස් හෝ එළු මස් හෝ තම සන්තකයෙහි තබාගෙන ඇති සෑම වෙළෙන්දෙකුම ඒ වෙළෙඳ පිලෙහි එම වර්ගයට හා ශ්‍රෙණියට අයත් හරක් මස් හෝ එළු මස් හෝ විකුණන වෙළෙඳ සැලෙහි පැහැදිලිව පෙනෙන සේ දැන්වීමක් ප්‍රදර්ශනය කළ යුතුය.

7. එක් ගනුදෙනුවක් කිරීමේදී හරක් මස්, එළු මස් සමග මාංශාවශේෂ විකුණනු ලබන විට හරක් මස් හෝ එළු මස් හෝ මාංශාවශේෂවලින් වෙන්කොට කිරා විකිණිය යුතුය.

8. සෑම වෙළෙන්දෙකුම හරක් මස් හෝ එළු මස් හෝ විකුණන කල්හි, හරක් මස් හෝ එළු මස් හෝ ගැණුම්කරු විසින් මිළයට ගන්නා හරක් මසෙහි හෝ එළු මසෙහි හෝ සැබෑ බර පහසුවෙන් බලාගනු හැකිවන සේ තම තරාදිය හෝ තරාදි තැබිය යුතුය.

9. මෙහිවූ උපලේඛනයේ සඳහන් වර්ගයේ සහ ශ්‍රෙණියේ හරක් මස් හෝ එළු මස් හෝ විකුණන සෑම වෙළෙන්දෙක්ම හරක් මස් හෝ එළු මස් හෝ ගැණුම්කරු විසින් ඉල්ලා සිටින විට පහත සඳහන් කරුණු දක්වෙන කුවිතාන්සියක් ඒ අයට දිය යුතුයි :—

 (අ) විකුණූ දිනය ;
 (ආ) විකුණූ හරක් මස් හෝ එළු මස් ප්‍රමාණය (බර අනුව) ;
 (ඇ) විකුණූ හරක් මස් හෝ එළු මස් හෝ වර්ගය, සහ ;
 (ඈ) විකුණූ හරක් මස් හෝ එළු මස් ප්‍රමාණයට ගෙවූ මුදල.

10. මෙම නියෝගයෙන් උපරිම මිළ නියම කරන ලද සෑම ප්‍රදේශයක් තුළම කිසිවෙකු විසින් උපලේඛනයේ සඳහන් භාණ්ඩ වෙන කිසියම් මසක් හෝ මාංශයක් සමග කළවම් කොට නොවිකිණිය යුතුය.

11. මෙහිවූ උපලේඛනයේ සඳහන් භාණ්ඩ විකුණන කල්හි ඒ භාණ්ඩ ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක් වෙතොත් එහි මිළද උපලේඛනයේ 2 සිට 5 දක්වා ඇති තීරයන්හි සඳහන් උපරිම මිළට ඇතුළත් විය යුතුය.

12. මෙම නියෝගයේ කාය‍්‍යීය සඳහා ' රාත්තල ' හෝ ' රා.' යන්න ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර ලෙස සැලකිය යුතුයි.

1964 දෙසැම්බර් මස 30 වන දින පෙ.ව. 10ට උහන දිසාපති කාය‍්‍යාලයේදී අත්සන් තබන ලදී.

රා. ග. සෝ. ඕ. ගුණසේකර,
අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර)
පාලක තැන.

## උප ලේඛනය

### හරක් මස් හා එළු මස්—උපරිම මිළ

| 1 වන තීරය ප්‍රදේශය | 2 වන තීරය හරක් මස් කටු රහිත රාත්තලක උපරිම මිළ රු. ශ. | 3 වන තීරය හරක් මස් කටු සහිත රාත්තලක උපරිම මිළ රු. ශ. | 4 වන තීරය එළු මස් කටු රහිත රාත්තලක උපරිම මිළ රු. ශ. | 5 වන තීරය එළු මස් කටු සහිත රාත්තලක උපරිම මිළ රු. ශ. |
|---|---|---|---|---|
| 1. අම්පාර නගරය හා වැවගම්පත්තු ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය ... ... ... | 0 80 | 0 60 | 2 50 | 2 0 |
| 2. සමන්තුරේ නගරය හා අම්පාර නගරය හැර සමන්තුරේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය ... ... | 0 80 | 0 70 | 2 50 | 2 0 |
| 3. කාරවාගුපත්තු හා නින්දවූර්පත්තු ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය ... ... ... | 0 90 | 0 70 | 2 50 | 2 0 |
| 4. අක්කරපත්තු ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය ... | 0 85 | 0 70 | 2 25 | 2 0 |
| 5. පානමපත්තු ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය ... | 0 80 | 0 60 | 2 25 | 2 0 |

**විශෙෂයෙන් සැළකිය යුතුයි.**—මේ මිළ ගණන්වලට ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ ගණන් අඩංගු නොවේ. මෙවා ඉහත සඳහන් ද්‍රව්‍යයන්ගේ උපරිම මිළ ගණන්ය. මේ මිළට වැඩි මිළකට විකිණීම නොකළ යුතුය.

1–420

ලංකාවේ වැලවිටේතයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් ".හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි